# චර්මයේ පෝෂණය සඳහා රක්තවහ ස්‍රෝතසේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

**කොළඹ විශ්ව විද්‍යාලයේ**
**දේශීය වෛද්‍ය විද්‍යායතනයේ**
**දර්ශනපති (ආයුර්වේද)**
පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන
නිබන්ධනය

**වෛද්‍ය**
**පී.පී.කේ.පෙරේරා**

ප්‍රධාන උපදේශක
වෛද්‍යා එස්.ජේ.නවරත්න
එම්.බී.බී.එස් - ඩී.එෆ්.එම්.
ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී

උපදේශක
වෛද්‍ය එම්.ජී.ඒ විද්‍යාරත්න
එච්.පී.ඒ. - ඩී.අයි.එම්.එස්.
ඩී.එස්.ඒ.සී - එම්.ඒ.සී.එෆ්.
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.

**ශරීර විඥාන අධ්‍යයන අංශය**
**දේශීය වෛද්‍ය විද්‍යායතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය - රාජගිරිය.**

IIM LIB
22026PR

2000 නොවැම්බර්

එම්. ෆිල් - 96/ 48

පුස්තකාලය
කොළඹ විශ්ව විද්‍යාලය
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# පස්වන පරිච්ඡේදය

## 5 - 1 සාරාංශය හා නිගමනය

මෙම නිබන්ධනයේ ඇතුලත් මාතෘකාව වූයේ ''චර්මයේ පෝෂණය කෙරෙහි රක්ත වහ ස්‍රොතසෙහි බලපෑම පිළිබඳ අධ්‍යයනයක්'' කිරීමය.

රක්තය චර්මයේ පෝෂණය කෙරෙහි බලපෑම පිළිබඳව පර්යේෂණයක් කිරීම සඳහා ම 'සිත පෙළඹවීමට ප්‍රධාන තම හේතුව වූයේ සියලු සත්ත්වයන් දෙස බැලීමේදී ශරීරය මතු පිට පෘෂ්ඨය හෙවත් ශරීරය ආවරණය කර ඇති සම පළමුව අපගේ දෘෂ්ටි ගෝචර වීමය.

ඈත අතීතයේ විසූ පැරැන්නෝ පංච කල්‍යාණය අතුරින් ඡවි කල්‍යාණය උසස් ලෙස සලකා ඇත්තේ ද මේ නිසාම විය හැක. මින් පෙනී යන්නේ ද සමේ පෝෂණයට ප්‍රධාන වශයෙන්ම රක්ත ධාතුවේ බලපෑම සිදුවන බවය. මේ පිළිබඳ පැහැදිලි කිරීමක් 43 වන පිටුවේ ''ත්වක් වර්ණොත්පත්තිය'' යටතේ දක්වා ඇත.

''රෝගාඃ සර්වේපි මන්දාග්නෞ'' යන ආයුර්වේදීය සිද්ධාන්තයට අනුව අප ශරීරයේ නා නා ප්‍රකාර වූ සියලුම රෝගයන්ට මන්දාග්නිය හෙවත් මඳ වූ අග්නිය ප්‍රධාන වන බව සඳහන් වේ. මන්දාග්නිය නිසා ඇතිවන දුශ්පෝෂණය රෝග වැළඳීමට ප්‍රබල හේතුවක් වන්නේ නම් එහි ප්‍රතිවිරුද්ධ පැත්ත වූ පෝෂණය රෝග නොවැළඳීමට සහ රෝග සමනයට හේතුවේ.

ජ්වර, අතීසාර, රත්පිත්, පාණ්ඩු, ග්‍රහණි, මාන්දම් සහ කුෂ්ට, විසර්ප, විස්ඵෝ්ය, රම්ප ආදී විවිධ රෝගයන්හී හේතු, සම්ප්‍රාප්ති, ලක්ෂණ, ආදිය විවිධ වූවත් එම රෝග ලක්ෂණ චර්මයෙන් ප්‍රකටව පෙන්නුම් කරන අතර, දූෂි විෂ සහ ආහාර ඖෂධ, සාත්මිකතා, අවස්ථාවලදී ද පළමුව රෝග ලක්ෂණ දක්නට ලැබෙනුයේ චර්මය මතිනි. මයට ප්‍රධාන හේතුව චර්මය ඇසුරු කරනු ලබන රක්තයේ පෝෂණ ඌනතාවය සහ පෝෂණ විකෘති තත්ත්වයන් බව සඳහන් කළ යුතුය.

සත්‍ය වශයෙන්ම අප ශරීරයට මනා පෝෂණයක් ලැබේ නම් එය චර්ම රෝග නොවැළඳීමට හේතුවක් විය යුතුයි. සිරුරට මනා පෝෂණයක් සැපයෙන විට රක්තය ර්ගයෙන් චර්මයට පෝෂණය ලැබේ. (පිටු අංක. 68 - 70)

ආයුර්වේදීය දර්ශනය අනුව, රස, රක්ත, මාංශ, මේද, අස්ථි, මජ්ජා, ශුක්‍ර යන ප්ත ධාතූන් අතුරින් චර්මයට මූලික වශයෙන්ම බලපාන්නේ රස ධාතුවය. මෙම රස තුව පෙර සඳහන් කළ පරිදි (පිටු අංක.12) රංජක පිතෙන් වර්ණවත් වී රක්තය ට පැමිණි පසු සියලු ශරීරය පෝෂණය කරනු ලබයි. මෙම රසයට සර්ව ශරීරයෙහිම න් කරන යන අර්ථය ද පැවසේ. මූලික සිද්ධාන්ත වලට අනුව රස ධාතුව යනු ප්ත ධාතූන්ගේ ආරම්භක ධාතුවය. ද්විතීය ධාතුව වන්නේ රක්ත ධාතුවය.

රස ධාතුව යකෘත් ප්ලීහා දෙකට පැමිණ රංජක පිත්තේ සංකලනයෙන් රක්ත ධාතුව බවට පරිණත වී නැවත හෘදය කරා පැමිණ දසවිධ ධමනි මගින් ශරීරය පුරා පතුරුවා හරිනු ලබන බවත්, ඉන් සකල ශරීරයේ පෝෂණය සිදු කරන බවත් චරක සහ සුශ්‍රැත මූලාශ්‍ර ග්‍රන්ථ දක්වා ඇත.

ආයුර්වේදයේ විද්‍යාත්මක වූ සත්‍ය එය නම් සෙසු ඉන්ද්‍රියනට මෙන්ම චර්මයේ පෝෂණය කෙරෙහිද රක්තය හෙවත් එම ස්‍රෝතස ඒකාකාරීව බලපාන බව මෙම නිබන්ධනයේ 69-70 පිටු වල ඇතුලත් අජගල්ලිකා, පාණ්ඩු, මාන්දම්, ආදී රෝග පිළිබඳ විමර්ශනය කිරීමේදි මා හට ප්‍රත්‍යක්ෂ විය.

ඉහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ මා, පළමුව චර්මය පිළිබඳ කරුණු අධ්‍යයනය කර ඒ අනුව චර්මයෙහි නිරුක්ති, ඒ පිළිබඳ විවිධ මත, විස්තර නිර්මාණය සහ නව්‍ය විද්‍යාත්මක උප කල්පනයන් කෙරෙහි අවධානය යොමු කෙළෙමි. එම පර්යේෂණයනට අනුව චර්මේ නිරුක්ති වශයෙන් (පිටු අංක 41 ) ''ත්වච්'' ධාතුවෙන් ''තජ්'' ප්‍රත්‍යය යෙදී ත්වක් ශබ්දය සෑදී ඇති බව හෙළි වූ අතර, එහි අදහස වූයේ ආවරණය යන්නයි.

චර්මයේ නිර්මාණය, චර්මයට අයත් ස්ථර 07 පිළිබඳ ව චරක, සුශ්‍රැත ආදී ආයුර්වේදීය මූල ග්‍රන්ථවල දක්වෙන විස්තර නවීන ග්‍රන්ථයන්හී දක්වෙන විස්තර වලට වඩා විද්‍යාත්මක පදනමක් මත පිහිටා ඇති බැව් මෙහිදී සක්සුදක් සේ පැහැදිලි විය.

නවීනයෝ කලලයට මාස 06 ක් පමණ වීමේදී ස්ථර 05 ක් සෑදී අවසාන බැව් දක්වා ඇති අතර, ආයුර්වේද ඍෂිවරු මීට වසර ගණනාවකට පෙර මේ අයුරින්ම ත්වචයේ උපත දක්වා ඇති බැව් සමේ ස්ථර පිළිබඳව කරන ලද (පිටු අංක 57-61) විමර්ශනයේදී පැහැදිලි විය.

චර්මයේ විවිධ ස්ථරවල ඝනකම දක්වන ව්‍රිහි 18/1, 16/1, 12/1 ආදී ප්‍රමාණයන් ගැන සලකා බැලීමේදී ව්‍රිහි යන්න පිළිබඳදව පොත පතෙහි ඇති කරුණු ගැනද, අවධානය යොමු කිරීමට සිදු විය. ව්‍රිහි යනු වී ඇටයක ප්‍රමාණය, යව ඇටයක ප්‍රමාණය සහ දහයියා පොත්තක ප්‍රමාණය යනුවෙන් විවිධාකාරව දක්වා ඇත. එහෙයින් ව්‍රිහි යන්නෙහි නියම ප්‍රමාණය ස්ථිර වශයෙන්ම නිගමනය කිරීම දුෂ්කර විය. එහි විවිධ මතයන්හි පවත්නා වෙනස කෙසේ වුවද, එම මාන ප්‍රමාණයන් අධි බලැති විද්‍යුත් අනුදක්නයකින් බැලිය නොහැකි තරමේ අති සූක්ෂ්ම ප්‍රමාණයක් බව පැහැදිලි වේ.

මින් ස්ඵුට වන්නේ වර්තමානයේ නව්‍ය විද්‍යාත්මකව අනුදක්නයක ආධාරයෙන් පරීක්ෂා කරනු ලබන කරුණු පිළිබඳ පෘථුල දැනුමක් අප පූර්වාචාර්යවරු සතුව තිබූ බවය. එසේම සමට අයත් ස්ථර අධිෂ්ඨාන කොට හට ගන්නා සිධ්ම, චර්මදල, පාමා, පාණ්ඩු, වැනි රෝග පිළිබඳව දක්වෙන විස්තර වලින්ද පැවසෙනුයේ එකී රෝග එම ස්ථර ආශ්‍රිතව හටගන්නා බවය. මේ ආකාරයෙන් රෝග හට ගැනීමේදී රක්තයේ පෝෂණ ඌනතා, සහ පෝෂණ විකෘති ඒකාකාරීව සමට බලපෑම මෙයට මුල කාරණය

වී ඇති බව මෙහිදි අනාවරණය විය.

එම රෝග සහ ස්ථර අතර පවත්නා අන්‍යොන්‍ය සම්බන්ධතාවය පිළිබඳව සලකා බැලීමේදී පෙනී යන්නේ ද ඉහත කී රෝග වලට ප්‍රධානම හේතුව පෝෂණය ඌනතාවය බවත්, ඒ සඳහා රක්තය ප්‍රධාන වශයෙන්ම බලපාන බවත්ය.

එසේම චිකිත්සා යන වචනයෙහි පර්‍යායක් වශයෙන් සඳහන් වන්නා වූ ''පත්‍ය'' යන්නෙන් පැවසෙනුයේද ''පථ'' හෙවත් ස්‍රෝතස් මාර්ගවලට හිතකර ක්‍රියාව චිකිත්සාව බවය. මෙසේ බලන කළ චර්ම රෝග ශාන්තිය සඳහා චිකිත්සා කළ යුත්තේ එම ඉන්ද්‍රියට අයත් ස්‍රෝතස් මාර්ගයටය. එනම් රක්තවහ ස්‍රෝතසටත්, එය ආශ්‍රය කරන චර්මයටත්ය.

රස ධාතුව ශරීරයේ පවත්නා කල්හි රක්තය වශයෙන් සලකනු ලබන අතර එය ශරීරයෙන් බැරවන කල්හි මල කොටස ස්වේදය වශයෙන් හඳුන්වනු ලබයි. මෙය චරක ආචාර්ය ''මාත්‍රාමාත්‍රත්ව මූෂ්මණ'' යනුවෙන් උෂ්ණත්ව පාලනය පිළිබඳ දක්වා ඇති අතර රෝම කූප මගින් ස්වේදය වහනය කිරීම පිළිබඳ ප්‍රත්‍යක්ෂ ශාරීර ප්‍රථම කාණ්ඩයේ ද්විතීය අධ්‍යායේ ආචාර්ය ගනනාථසෙන් මෙසේ සඳහන් කර ඇත.

එනම්, ''ස්වේද වහානාම් රොමනාපි යනුවෙනි. මේ අනුව ශරීර ඌෂ්ණත්වයේ සමතාවය සහ ශරීර තාපය අඩු හෝ වැඩි වීම චර්මයේ ප්‍රධාන ක්‍රියාවක් ලෙස දැක්විය හැක. මෙහිදී ද ක්‍රියාත්මක වනුයේ චමයට රක්තවහ ස්‍රොතසෙන් ලැබෙන්නා වූ පෝෂණත්වයයි. මෙයට නිදසුන් ලෙස ගතහොත් යහපත් උණුසුම ඇති පරිසරයකදී සමේ තාපය වැඩිවන අතර උණුසුම අඩු රාත්‍රි කාලයට තාපය අඩුවීම දැක්විය හැකිය.

ශරීර තාපය පවතින අවස්ථාවේදී සමේ ඇති රුධිර නාල බිත්ති පළල් වන අතර එහිදී සමට රුධිර සම්පාදනය වැඩිවේ. මේ හේතුවෙන් ස්වේද ග්‍රන්ථි වහා ක්‍රියාත්මක වන අතර එමගින් සම මතුපිට දහඩිය වාෂ්ප වේ. මෙහිදී සම සිසිල් බවට පත්වේ. මේ අවස්ථාව ආයුර්වේද වෛද්‍ය විද්‍යාව අනුව පිතේ ගුණයන්ට සමාන වන අතර මෙහිදී රක්තයට බලපවත්වන දෝෂය පිත බවද සඳහන් කළ යුතුය.

ආයුර්වේද මූළ ධර්ම අනුව ආශ්‍රය ආශ්‍රයීය සිද්ධාන්තය මෙහිදි දැක්විය හැකි අතර (හැඳින්වීම) මේ ආකාරයෙන් චර්මයේ පෝෂණ ක්‍රියාවලිය රක්ත වහ ස්‍රොතස මගින් සිදුවන බව එක හෙලාම ස්ඵුට වේ. එසේම පෙර සඳහන් කළ පරිදි හෘදයෙන් ආරම්භ වන රස ධාතුව යකෘත් ප්ලීහා දෙකට පැමිණ රංජක පිතේ ආධාරයෙන් නියම රක්තය බවට පරිණත වීම සත්‍ය වන්නේ නම් නව්‍ය විද්‍යාත්මකව රක්ත වර්ණය ලබා දෙන හිමොග්ලොබින් වර්ණකර පදාර්ථය ආයුර්වේදානුකූල රංජක පිතම බව සක්සුදක්සේ පැහැදිලි වන්නේය. මෙකී සාධක පදනම් කර ගෙන මා විසින් කරන ලද විමර්ශනයේදි පැහැදිලි වූයේ ද රක්තයේ නිර්මාණය සහ ක්‍රියා පිළිබඳ දක්වා ඇති ආයුර්වේදීය මත බොහෝ සෙයින් ආයුර්වේදීය මූල ධර්ම හා නව්‍ය මත හා සැසඳෙන බවය.

කරුණු මෙසේ හෙයින් මෙම නිබන්ධනයේ ම විසින් සඳහන් කර ඇති අසෘක්, රක්ත, ලෝහිත, ත්වග් ජම්, ප්‍රාණ දම්, ආදී රක්ත පර්යාය වලින්ද පැවසෙනුයේ

රක්තයේ ප්‍රධාන ක්‍රියාවන් බව පැහැදිලි වන අතර ත්වග් ජම්, ප්‍රාණ දම් ආදී පර්යායන්ගෙන් ස්ඵුට වනුයේ චර්මයේ උපත, පෝෂණය, එකහෙළාම රක්තයෙන් තොරව සිදු නොවන බවය.

එසේම රස රක්තාදී සප්ත ධාතුන්ගේ ප්‍රථම ධාතුව වන රස ධාතුව ත්වචය ඇසුරු කරනු ලබන බව ආයුර්වේද මූල ග්‍රන්ථ සඳහන් කරන අතර කාය චිකිත්සක ආචාර්ය සී. ද්වාර්කනාථ ''රසෝ අසෘක්-රසෝ වෛසඃ'' යනුවෙන් රස රක්තය හෙවත් රක්තය රසය (පිටු 15 ) බවත් දක්වා ඇත. මෙහිදී රස රක්තය එකම පදාර්ථයක් වේ නම් එම පදාර්ථ ඇසුරු කරනු ලබන චර්මය එම පදාර්ථයෙන්ම (රස රක්ත) පෝෂණය විය යුතු බව ඉහත කී කරුණු වලින් ස්ඵුට විය.

මෙසේ සියලුම විවිධ මත විමර්ශනයට ලක්කර මවිසින් සකස් කරන ලද මෙම පර්යේෂණයෙහි අවසාන වශයෙන් ලබාගත් දැනිම වන්නේ චර්මයේ පෝෂණයට රක්තය බලපාන බවත්, එම බලපෑම පිළිබඳව පෙර පර සියලුම මතයන්හී සමානත්වයක් ඇති අතර, විශේෂයෙන්ම ආයුර්වේදීය පුරාණාචාර්ය මත ඉතා පැහැදිලි විද්‍යාත්මක පසුබිමක් ගවේෂණය කර එම අදහස් ග්‍රන්ථාරූඪ කර ඇති ආකාරයත්ය.

මෙහි පෙර සඳහන් කරන ලද චර්මයේ පෝෂණ විකෘති තත්වය නිසා හට ගන්නා පාණ්ඩු, මාන්දම්, කුෂ්ට, විසර්ප, පිඩකා, කණ්ඩු ආදි රෝග තත්වයන් සඳහා යොදනු ලබන ඖෂධ යෝගාදී උප යෝගයන් පිළිබඳව ක්‍රමවත් ශායනික පර්යේෂණයක් කළහොත් රක්තවහ ස්‍රොතස, සමේ පෝෂණය කෙරෙහි බලපෑම සම්බන්ධව මීට වඩා පෘථුල දැනුමක් ලබා ගත හැකිය.